# බළන්ගොඩින් ගැලූ පැණසර මෙත් ගඟුල

19

චතුර දේශකත්වය ද ශූර ලේඛකත්වය ද මහාර්ඝ ශික්ෂාකාමිත්වය ද සුසංයෝග වූ අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය බළංගොඩ ආනන්ද මෛත්‍රේය හිමිපාණෝ විසිවන සියවසේ පහළ වූ කීර්තිමත් පැවිදි පඬිවරයෙකි. මෙරට භාෂා ශාස්ත්‍ර උන්නතිය පිණිසත් බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීම පිණිසත් උන් වහන්සේ කළ මෙහෙවර අපරිමිත ය. අසීමිත කැපවීමකින් ස්වෝත්සාහීව අධ්‍යාපනය ලැබූ උන් වහන්සේ ජීවිත කාලය පුරා ලද විවිධ තනතුරු, ගරුනාම ස්වකීය පරාර්ථ චර්යාවට බාධාවක් කර නො ගත්හ. අල්පේච්ඡ ජීවිතයක අනර්ඝත්වය ආදර්ශයෙන් විශද කළ උන් වහන්සේ භාවනානුයෝගීව ස්වකීය චිත්ත ශක්තිය දියුණු තියුණු කර ගත්හ. අභියෝග හමුවේ නො සැලුණු උන් වහන්සේ සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත, වංග, ඉංග්‍රීසි, ලතින්, ජර්මන් ආදි පෙරපර දෙදිග භාෂා පිළිබඳ පෘථුල අවබෝධයකින් ජාත්‍යන්තර බෞද්ධ ධර්ම ශාස්ත්‍රීය සේවය පිණිස කළ සම්ප්‍රදානය සදානුස්මරණීය ය.

පහත දැක්වෙන්නේ උන් වහන්සේගේ චරිතාපදානයේ සාරාංශයකි.



ගුවන් ගැබ අරා පුරාහඳ සුදිලෙයි. තුරුපත් අතරින් පෙරී ආ සඳරැසින්  බළන්ගොඩ, කිරිදිගල ගම්මානයේ උරස්සවත්ත නිවස ආලෝකවත් විය. මිදුල පුරා ඇඳෙන අපූරු සෙවණැලි මැදින් නාගොඩ ආරච්චිගේ මෙතියස් අප්පුහාමි හෙවත් මද්දුමහාමි පිය පදවිය අපේක්ෂාවෙන් නො ඉවසිල්ලෙන් ඔබ මොබ සක්මන් කරයි. උපකාරයට පැමිණි අසල්වැසි ආප්ත ගැහැනු කිහිප දෙනෙක් යුහුසුලු වෙති. ඒ 1896 අගෝස්තු 23 දා ය. රාත්‍රි 12 පසු වී විනාඩි 03ට බෙන්තර ආරච්චිගේ හීන්මැණිකේ පින්සාර පුතකු බිහි කරමින් උත්තරීතර මවු පදවිය උරුම කර ගත්තී ය. උපන් දරුවා විලියම් හෙවත් පුංචි මහත්තයා නම් විය. ඒ බිලිඳා අන් කවරකුවත් නො ව පසු කලක දී සසුනඹර පුරහඳක් වෙමින් බොදු ලොව එකලු කළ අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය  බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය හිමිපාණෝ ය.

මවුපිය නැහිතමිතුරන්ට සතුට ගෙනා පුතුට මවු උණුසුමේ නැළවෙන්නට වාසනාව ලැබුණේ දෙසතියකි. හීන්මැණිකේ මාතාව කලුරිය කළා ය. තම ආදරණීය බිරිඳගේ අකල් වියොවින් කම්පනයට පත් මද්දුමහාමි මහතා ගම හැර ගියේ ය. පුංචි පුතුට ලොකු අම්මා සහ මහප්පා මවුපිය සෙනෙහස නො අඩුව ලබා දෙන්නට කැප වූහ. ඔවුහු දරු සෙනෙහසින් ඔද වැඩුණු සිත් ඇතිව පුංචි විලියම් පිළිබඳ කටයුතු සියල්ල  නො පිරිහෙළා සම්පාදනය කළහ.

සුරතල්, දඟකාර විලියම් පිනට දහමට යොමු වීමට සංසාරගත පුරුද්ද මෙන් ම ආතාගේ ඇසුර ද බෙහෙවින් හේතු විය. සය හැවිරිදි විලියම් කිරිදිගල පල්ලියට අයත් කතෝලික පාසලට ඇතුළු කෙරිණ. වන සිරි විඳිමින් ඇළදොළ මැදින් ගිය පාසල් ගමන ඔහුට ප්‍රීතිමත් ළමා කාලයක් උරුම කර දුන්නේ ය.

නිවසේ දී වයලීනය වාදනයට යොමු වූ ඔහු ගායනයට ද සිතුවමට ද උපන් දක්ෂයෙක් විය. පසු ව ඔහු බළන්ගොඩ කුමාර විද්‍යාලයට ඇතුළත් කෙරිණි. එම විද්‍යාලයේ විශේෂත්වයක් වූයේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන සියලු ජාතීන්ට අයත් දරුවන් අධ්‍යාපනය ලැබීම යි. ආනන්ද මෛත්‍රේය නාහිමිපාණන් පවසන පරිදි කුඩා කල හොඳ ම මිතුරා වූයේ මුස්ලිම් ජාතික අබ්දුල් මජීද් ය. තම ළමා කාලය ස්මරණය කරමින් ඒ හිමිපාණන් පවසන්නේ සෑම ජාතියක් ම එකට මිත්‍රව ජීවත් වීම නිසා කුල, පන්ති, ආගම් භේද දුරු වී යන බව යි. බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍ර තුමා පැවැත්වූ දේශනයක් ශ්‍රවණය කරන්නට ලැබීම විලියම් දරුවාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය විය. සියවස් ගණනාවක් පුරා අධිරාජ්‍යවාදීන්ට නතු වීම නිසා මෙරට සමාජ, සංස්කෘතික දේහය අතිශය ඔත්පළව පැවතිණ. එම වකවානුවේ රට දැය සමය නිදහස් කිරීම උදෙසා ජාතික ව්‍යාපාරය ප්‍රබෝධවත්ව ක්‍රියාත්මක වෙමින් පැවතිණ. වලිසිංහ හරිශ්චන්ද්‍ර තුමාගේ දේශමාමකත්වයෙන් ඔපවත් වූ හැඟීම් සමුදාය විලියම්ගේ පුංචි සිතට තදින් කාවැදිණි. ආතාගේ දැනුවත් කිරීම මත විලියම් යන නම අත්හැර සිංහල ක්‍රමයට පුංචි මහත්තයා යන්න භාවිත වූයේ ඉන් අනතුරුව ය. ඔහුට සසුන්ගත වීමේ අවශ්‍යතාව ජනිත වන්නේ උක්ත දේශනයෙන් ලැබූ උද්දීපනය හේතු කොට ගෙන ය.

කුඩා කල සිට ම ප්‍රශ්න කිරීමට හා විමසීමට තිබූ රුචිය ඔහුගේ බුද්ධි ප්‍රබෝධයේ පදනම විය. කියවීම විනෝදාංශය කර ගත් විලියම් සත් වන පන්තියේ දී **ජාතක පොත, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය** ආදි චිරන්තන සාහිත්‍ය කෘති කියවා තිබුණේ හැදෙන ගහ දෙපෙත්තෙන් පෙනෙන බව තහවුරු කරමිනි. එමෙන් ම  සතිපතා පුවත්පත් හා සඟරා සියල්ල දැඩි උනන්දුවෙන් කියවීම ඔහු පුරුද්දක් කොට ගත්තේ ය. බුදුදහම රකිනු වස් සසුන්ගත වීමේ අදිටන ප්‍රබල වූයේ ඉන් අනතුරුව ය.

1911 මාර්තු 02 දා මෙරට ශාසන ඉතිහාසයේ අනුස්මරණීය දිනයක් බවට පත් කරමින් පුංචි මහත්තයා කුල කුමරා දෙණිහේනේ සීලානන්ද නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් පැවිදි බිමට ඇතුළත් විය. වයස අවුරුදු දහහතරක් වුව ද මුහුකුරා ගිය බුද්ධියකින් යුතු සාමණේර හිමියෝ ස්වයං විනයකින් තම චරිතය දිනෙන් දින ඔපවත් කර ගනිමින් සිටියහ. මෛත්‍රේය හිමියෝ ස්වකීය ආචාර්යයන් වහන්සේ වෙතින් ම ධර්ම ශාස්ත්‍ර ඥානය හා මූලික ඉංග්‍රීසි දැනුම වර්ධනය කර ගත්හ. රාත්‍රි සැතපෙන වේලාව පැය දෙක හමාරකට සීමා කර ගත්තේ 'කැපවීමෙන් තොර ජයග්‍රහණ නැත' යන්න සනාථ කරමිනි. කාලය කළමනාකරණයෙහි ලා උන් වහන්සේ තුළ වූ ශක්‍යතාව ආධ්‍යාත්මික ශක්තිය දියුණු කර ගැනීමට පදනම විය. නැණසර ගුරු හිමියෝ සිය ශිෂ්‍ය හිමියන්ගේ දූල්සර අනාගතය අවබෝධ කර ගත් නිසා ම දුර බැහැර ගමනක් යන අවස්ථාවක දී ද ශිෂ්‍ය හිමියන් කැටුව ගිය අතර සෑම මොහොතක ම කලින් දුන් පාඩම විමසීමට ලක් කළහ. දාමහන ධම්මානන්ද ස්වාමීන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් 1916 ජූලි මස 14 වන දින බළන්ගොඩ ඕලු ගඟ උදකුක්ඛේප සීමා මාලකයේ දී උපසම්පදාව ලැබූ මෛත්‍රේය හිමියෝ සක්මනෙහි දී පවා පාලි සංස්කෘත ශ්ලෝක සජ්ඣායනය කරන්නට පුරුදු වී සිටියහ. ගුරු හිමියන්ගේ මෙහෙයවීම ද ස්වාධ්‍යයනයෙහිලා ගැඹුරින් නිරත වීම ද නිසා පාලි සංස්කෘතාදි ප්‍රාචීන භාෂා පිළිබඳ නෛපුණ්‍යයක් ලද ආනන්ද මෛත්‍රේය හිමියෝ 1919 දී කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත්ව ආනන්දයෙන් යුතුව වැඩිදුර ඉංග්‍රීසි අධ්‍යාපනයට යොමු වූහ. 1922 වන විට ඒ හිමියෝ ආනන්දයේ පාලි, සංස්කෘත, සිංහල හා බුද්ධ ධර්මය උගන්වන ගුරුවරයා ලෙස පත් වූහ. පසුව නාලන්දා විද්‍යාලයේ සමාරම්භක ගුරුවරයකු බවට පත්ව නාලන්දා විදුහල් නාමයත් "අපදාන සෝභිනී පඤ්ඤා" යන ආදර්ශ පාඨයත් නිර්මාණය කිරීම අර්චනීය සිදුවීමකි.

ඉංග්‍රීසි ප්‍රමුඛව ජර්මන්, ප්‍රංශ යන ප්‍රතීචීන භාෂා පිළිබඳව ද ඒ හිමියන් ලද ප්‍රවීණත්වය අතිමහත් ය. උන් වහන්සේගේ භාෂාන්තර ඥානය ධර්මදූත සේවයෙහි යෙදුණු ආකාරයෙන් ද නිර්මිත ශාස්ත්‍රීය ග්‍රන්ථ සමූහයෙන් ද සාධනය වේ. එක විෂයකට සීමා නොවුණු උන් වහන්සේට අලුත් දේ ඉගෙනීමටත් අත්හදා බැලීමටත් තිබුණේ නො සිඳෙන පුදුමාකාර උනන්දුවකි. සිලෝ හැදීම, බැදීම සිංහල, පාලි, සංස්කෘත භාෂාත්‍රයෙන් ගද්‍ය, පද්‍ය රචනා කිරීම මෙන් ම චිත්‍ර ඇඳීම හා ප්‍රතිමා නෙළීමට ද උන් වහන්සේ සතු වූයේ සහජ දක්ෂතාවකි. සාම්ප්‍රදායික භික්ෂු අධ්‍යාපන ක්‍රමවේදය අනුමත කළ උන් වහන්සේ නව ප්‍රවණතාවල සාධනීය ලක්ෂණ උකහා ගත්තේ විවේක බුද්ධියෙනි. වයස අවුරුදු අසූවේ දී පරිගණක විද්‍යාව ඉගෙනීමට යොමු වීම එහිලා කදිම නිදසුනකි. ඒ නිසා බළන්ගොඩ මහ නාහිමියෝ පැරැන්නකු වූවා මෙන් ම, වාර්තමානිකයකු ලෙස ද කටයුතු කළ හැකි ජීව ගුණයකින් හා ශක්තියකින් යුක්ත වූහ.

ශ්‍රී ලංකා භූමි සීමාව අතික්‍රමණය කළ උන්වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව ඉන්දියාව, බුරුමය, සියම, ජපානය, චීනය, කොරියාව, තායිවානය ආදි පෙරදිග රටවල සහ බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, අමෙරිකාව, කැනඩාව, ස්විට්සර්ලන්තය, ස්වීඩනය ආදි අපරදිග රටවල ද පැතිරිණි. සමයාන්තර දැනුමෙන් සන්නද්ධ වූ උන් වහන්සේ බුදුන් වදාළ දහම් මග හෙළිපෙහෙළි කරන්නට පරමාදර්ශීව කටයුතු කළේ අප්‍රතිහත ධෛර්යයෙනි. උන් වහන්සේ ප්‍රථම ධර්මදූත සේවය ආරම්භ කළේ කේරළයේ කැලිකට් නගරයේ රාජ්‍ය මන්ත්‍රී ශ්‍රී ක්‍රිෂ්ණා මහතාගේ ආරාධනයෙනි. පසුව ධර්මදූත හා වන්දනා කටයුතු සඳහා භාරතයට පමණක්

තිස් හය වතාවක් වැඩම කිරීම උන් වහන්සේගේ ධර්මදූත සේවය සඳහා කැප වීම කෙතෙක් ද යන්න සනාථ කිරීමකි.

බුද්ධ ශාසනයේ චිර පැවැත්ම පිණිස ශික්ෂාකාමී සාරවත් ශිෂ්‍ය භික්ෂු පරපුරක් බිහි කරන්නට මෛත්‍රේය ගුරු හිමියන් කළ මෙහෙය සදානුස්මරණීය ය. පොදු වස්තුවක් වන භික්ෂුව, දේශපාලනය වැනි පරිබාහිර ලෞකික සංකල්ප දරා සිටීම පරිහානියට හේතු වන බව උන් වහන්සේ තදින් කියා සිටියහ.

1954 ජනවාරි 08 දින සබරගමු සද්ධම්මවංශ නිකායේ සංඝනායක පදවියට පත් වූ ආනන්ද මෛත්‍රේය හිමියෝ දඹදිව ඉසිපතනාරාමයේ විහාරාධිපති ධුරයට ද පත් වූහ. උන් වහන්සේගේ ශාස්ත්‍රවන්තභාවය අන්තර්ජාතික සම්භාවනාවට පාත්‍ර වූ බව 1954 දී බුරුමයේ පැවැති ඡට්ඨ සංඝායනාවේ දී උත්තරීතර අවසාන ශෝධක මණ්ඩලයට පත් වීමෙන් ද අට්ඨකථා සංගායනා වාරයේ දී සභාපති ධුරයෙන් පිදුම් ලැබීමෙන් ද සාධනය වේ. එහි දී ප්‍රකට කළ ධර්ම විශාරදත්වය නිසා ම බුරුම රජය විසින් අග්ගමහා පණ්ඩිත උපාධියෙන් උන් වහන්සේ සම්මානයට පාත්‍ර කරන ලදහ.

එදා විද්‍යෝදය විශ්වවිද්‍යාලය නමින් හැඳින්වුණු වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහායාන බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය ධුරයට ද පසුව පීඨාධිපති ධුරයට ද පත් වූ උන් වහන්සේට එම විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍යසූරී උපාධියත් කැලණි විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍ය චක්‍රවර්ති උපාධියත් පිරිනමන ලද්දේ අසමසම ශාස්ත්‍ර ඥානයට සම්භාවනා වශයෙනි.

තනතුරු හා ගරු නම්බුනාම ඍජුව ම ප්‍රතික්ෂේප කිරීමට තරම් උන්වහන්සේ අව්‍යාජ වූහ. ඉන්දියාවේ නාලන්දා විශ්වවිද්‍යාලයේ හා කල්කටා විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානයන් නිහතමානීව ප්‍රතික්ෂේප කිරීම මීට නිදසුනකි. උන් වහන්සේ තනතුරු භාර ගත්තේ ඉන් පරහට වන සුබසෙත පිළිබඳ කාරුණික හැඟීමෙනි. අමරපුර සංඝ සභාවේ සභාපති ධුරය මුලින් ප්‍රතික්ෂේප කළ ද පසුව බොහෝ දෙනා තනතුර භාර ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කළ විට අන් මත ගරු කිරීමේ උදාර ගුණය ප්‍රකට කරමින් උන්වහන්සේ ඊට කැමැත්ත ප්‍රකාශ කළේ සංඝ සාමග්‍රිය පිළිබඳ දැඩි හැඟීමෙනි.

කිත් යසස්, පදවි, තානාන්තර සියල්ල තමා පසුපස ලුහුබැඳ එද්දීත් උන් වහන්සේ සුපුරුදු ජීවන රිද්මය අත් නො හළහ. තනතුරුවලින් ලත් වරප්‍රසාද කෙරෙහි නො ව තත්ත්වය හා කාර්ය කොටසට අදාළ යුතුකම් හා වගකීම් පිළිබඳව සිත යොමු කිරීම මුන් වහන්සේගේ විශේෂත්වයකි. බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය හිමියෝ ජංගම විශ්වකෝෂයක් බඳු ය. සියත් බවින් ද වියත් බවින් ද ඔපවත් වූ උන් වහන්සේගේ ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණ සමූහය අර්ථ සම්පන්න ජීවිතයක සදාතනික සිහිවටන වේ. එහිමියන් විසින් නිර්මිත ග්‍රන්ථ සමූහය අසූවකට අධික ය. දේශන, අධ්‍යයන ලිපි ආදිය මෙපමණැකැ යි කිව නො හැකි තරම් ය. ලක්මිණි පහන, මගේ සඟරාව, ස්වදේශ මිත්‍රයා, සිංහල ජාතිය, සිංහල හඬ, ධර්ම විජය, ධර්ම රශ්මි ආදිය මාහිමියන්ගේ අදහස්වලින් නිරතුරුව සපිරිණි. විසිවන සියවසේ මුල් භාගයේ පළ වූ මෙම පුවත්පත් හා සඟරාවලට සැපයුණු ලිපි ක්‍රිස්තියානිකයන්ගෙන් එල්ල වූ තර්ක ඛණ්ඩනය කොට බෞද්ධ සංකල්ප සාධනය කිරීම අරමුණු කොට ගෙන ඉදිරිපත් විය. සුපේශල භික්ෂුවක වශයෙන් ධර්ම ඥානයෙන් ප්‍රභාවත් වූ බුද්ධියෙන් අවබෝධ කර ගත් සංකල්ප පරහිතකාමීව අන්‍යයන්ට බෙදා දීමට පුවත්පත් සඟරා ආදිය යොදා ගැනීම වැඩදායක විය. 1928 දී ලියූ ශාක්‍යසිංහාවදානය හෙවත් බුද්ධ චරිතය ගිහි පැවිදි කාහටත් සඵලදායක ආකාරයෙන් සකසා තිබිණි. උන් වහන්සේ විසින් රචිත

සංක්ෂිප්ත දික්සඟිය සම්පූර්ණ සිංහල ව්‍යාඛ්‍යානයකි. ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ අතර ධම්මපද ව්‍යාඛ්‍යාව, සංයුක්ත සගාථක වර්ග ව්‍යාඛ්‍යාව, මජ්ඣිම නිකාය ප්‍රථම වර්ග ව්‍යාඛ්‍යාව, ඛුද්දක වර්ග ව්‍යාඛ්‍යාව ආදිය ප්‍රමුඛ වේ. ඊට අමතරව බෞද්ධ පාඨ ග්‍රන්ථ, සංස්කරණ ග්‍රන්ථ, භාෂාන්තර ශික්ෂක ග්‍රන්ථ, පරිවර්තන ග්‍රන්ථ, ජ්‍යෝතිෂ, වෛද්‍ය සහ ඉංග්‍රීසි ග්‍රන්ථ රාශියක් උන් වහන්සේ විසින් රචිත ය.

සිංහල නවකතාවේ ප්‍රාරම්භක සමයේ ම උන් වහන්සේ **නයිගම පන්සලේ නායක හාමුදුරුවෝ** නමින් නවකතාවක් එළිදැක්වීම අසිරිමත් සිදුවීමකි. නූතන භික්ෂු සමාජයෙහි යථාර්ථය නිර්භය ලෙස නිරූපණය කොට පෙන්වා දීමට උන් වහන්සේ එම නවකතාව උපයෝගි කර ගත්හ. ඒ වන විට කිසිදු යතිවරයකු නවකතාකරණයට අත ගසා තිබූ බවට ඓතිහාසික සාක්ෂ්‍යයක් හමු නො වේ. ඉන් අනතුරුව ද **කාමනීත, කාරුණික තාරා** යන රමණීය ආධ්‍යාත්මික නවකතා යුගල සිංහලට පරිවර්තනය කිරීම සුවිශේෂ කරුණකි. උන් වහන්සේ නවකතාව ගර්හිත කලාවක් ලෙස නො සලකා ජනතාව ඥානනය කළ හැකි යථාර්ථවාදී කලාවකැයි විශ්වාස කළ බව මෙම නිර්මාණවලින් සුවිශද ය. ඉන් ඒ හිමියන්ගේ ප්‍රගතිශීලී චින්තනය විද්‍යමාන ය.

පුද්ගලයකු තුළ ඉතා කලාතුරකින් පිහිටන භාෂාන්තර හා සමයාන්තර ඥානයක් හා විස්මයාවහ ධාරණ ශක්තියක් උන් වහන්සේ තුළ පැවති බව මේ ප්‍රශස්ත නිර්මාණ සරණියෙන් සුවිශද ය.

ආනන්ද මෛත්‍රේය හිමියන්ට අනන්‍ය වූ විශිෂ්ට චර්යාත්මක ගුණ සමුදාය සියලු දෙනාට ආදර්ශවත් ය. බළන්ගොඩ ප්‍රදේශයේ වැඩි කලක් වාසය කළ ද ඥාති සංග්‍රහයට කිසි විට යොමු නො වුණු උන් වහන්සේ මවුපිය උරුමයෙන් ලද සියල්ල ශාසනාභිවෘද්ධිය සඳහා කැප කළහ. ගුරු සේවයෙන් ලද වැටුප පවා භික්ෂු ශිෂ්‍යත්ව අරමුදලකට බැර කරන ලදි. බළන්ගොඩ පිරිවෙනක් ආරම්භ කරමින් එය ධර්මානන්ද පිරිවෙන ලෙස නම් කළේ ස්වකීය ප්‍රචාර්ය දාමහන ධම්මානන්ද මාහිමියන්ගේ ශ්‍රී නාමයට පූජෝපහාරයක් වශයෙනි. අනූ වියැති උන් වහන්සේ දිනක් රට දෙල් පැළයක් සිටුවද්දී සාමණේර හිමිනමක සිනා සෙනු දුටු විට පැවසුවේ "මොක ද? මට දෙල් කන්න ලැබෙන්නේ නැති නිසා දැ" යි කරුණා පරවශව ප්‍රතිචාර දැක්වූයේ පරාර්ථකාමී චර්යාව සනාථ කරමිනි. සියලු සතුන් විෂයයෙහි පතළ මහා කරුණාවෙන් කටයුතු කළ උන් වහන්සේ අසරණ සතකු දුටු විට දී කළ හැකි උපකාරය ඉතා සැලකිල්ලෙන් හා කැමැත්තෙන් සිදු කළේ බුද්ධ පුත්‍රයකුගේ පිළිවෙත් සපිරි දිවියේ අරුත මේ යැයි විශද කරමිනි.

මෛත්‍රේය හිමියන්ගේ මහා පාණ්ඩිත්‍යය ප්‍රඥා බලමහිමය අබිමුව උගතුන් යැයි කියා ගන්නා බොහෝ දෙනා හිරු දුටු කදෝපැණියන් සේ ය. "පෙරදිගට ගියත් අපරදිගට ගියත් මට පිළිතුරු දෙන්නට බැරි දෙයක් කවුරුවත් නො අසති" යන අභීත සිංහනාදය උන් වහන්සේ මුවින් පිට වීමෙන් එය සාධනය වේ. තව දුරටත් මින් ගම්‍ය වන්නේ තමන් වහන්සේ අත් පත් කර ගත් දැනුම් සම්භාරය පිළිබඳ ඇති ප්‍රත්‍යක්ෂ විශ්වාසය යි. ක්‍රමයෙන් වයෝවෘද්ධ වන විට මනෝවෘද්ධ වූ ආකාරය අසිරිමත් ය. කෙතරම් ශාස්ත්‍රීය, ආගමික හා සමාජීය කටයුතුවල නිරත වුව ද දෛනික වතාවත් ඉටු කිරීම ද භාවනානුයෝගීව ආධ්‍යාත්මික සැපත ළඟා කර ගැනීමට ක්‍රියා කිරීම ද කිසි විටෙකත් අතපසු නො වීමට වග බලා ගත් අයුරු විස්මිත ය.

සති කිහිපයක් අසනීපව සිටි බෝධිසත්ත්ව ගුණෝපේත අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමිපාණෝ 1998 ජූලි 18 දා අපවත් වී වදාළහ. ධර්මධරත්වය, විනයධරත්වය, ශික්ෂාකාමීත්වය, ඥානවන්තභාවය, බහුශ්‍රැතභාවය යන සංඝ ශෝභන ගුණාංගවලින් සුපුෂ්පිත වූ උන් වහන්සේගේ දීර්ඝායුෂ්ක ජීවිතය, සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියටත් ලෝකවාසී බෞද්ධ ජනතාවගේ උත්තම අභිමතාර්ථ සාධනයටත් පරමාදර්ශයකි.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| ආප්ත | - වැඩිහිටි; දැනුමැති |
| උද්දීපනය | - හැඟීම් දල්වන/තියුණු කරන/ප්‍රබෝධ කරන |
| චිරන්තන | - පුරාතන |
| නැණ සර | - ප්‍රාඥයා |
| උදකුක්ඛේප සීමා මාලකයේ දී | - භික්ෂු විනය කටයුතු සඳහා ගංගා ආදියෙහි ඇති කර ගනු ලබන සීමාව |
| ස්වාධ්‍යයනයෙහි | - තමා ම ඉගෙනීම |
| නෛපුණ්‍යයක් | - නිපුණත්වයක් |
| අර්චනීය | - පිදිය යුතු |
| ප්‍රාචීන භාෂා | - පෙරදිග භාෂා |
| ප්‍රතීචීන භාෂා | - අපරදිග භාෂා |
| භාෂාන්තර ඥානය | - විවිධ භාෂා පිළිබඳ දැනුම |
| අතික්‍රමණය | - ඉක්මවා යෑම |
| අප්‍රතිහත | - නො බිඳුණු/නො කැඩුණු |
| ඡට්ඨ සංගායනාව | - සය වන සංගායනාව |
| කිත් යසස් | - කීර්තිය හා යශස |
| සියත් බවින් | - ස්වීයත්වයෙන් |
| වියත් බවින් | - උගත් බව/පණ්ඩිත බව/විද්වත්භාවයෙන් |
| දික් සඟිය | - දීඝ නිකාය |
| ව්‍යාඛ්‍යාන | - අර්ථ විවරණ ග්‍රන්ථ හෙවත් දහම් පොතක අරුත් පැහැදිලි කරමින් ලියූ පොත් වර්ගයකි. |
| විස්මයාවහ | - පුදුමය ගෙන දෙන |
| කරුණා පරවශ | - කරුණාව මුල් කොට ගත් |
| කදෝපැණියන් | - කණාමැදිරියන් |
| චිරස්ථිතියට | - බොහෝ කාලයක් පැවතීමට |

## අවබෝධය

1. විලියම් දරුවාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය වූයේ කුමක් ද?
2. විලියම් දරුවාගේ සිතේ සසුන්ගත වීමේ අරමුණ ප්‍රබල වීමට බලපෑ හේතු කවරේ ද?
3. 'කැප වීමෙන් තොර ජයග්‍රහණයක් නැත' යන ආදර්ශ පාඨයට අනුව උන් වහන්සේ ජීවිතය සකස් කර ගත් බවට ලැබෙන සාධකය කුමක් ද?
4. බුරුම රජය අග්ග මහා පණ්ඩිත උපාධියෙන් උන් වහන්සේ සම්මානයට බඳුන් කළේ කුමක් නිසා ද?
5. 'පෙරදිගට ගියත් අපරදිගට ගියත් මට පිළිතුරු දෙන්ට බැරි දෙයක් කවුරුවත් නො අසති' මේ ප්‍රකාශයෙන් උන් වහන්සේගේ කවර ලක්ෂණයක් ප්‍රකට වේ ද?

## ලිඛිත අභ්‍යාස

(අ) නිවැරදි වාක්‍යයක් තැනීමට සුදුසු ක්‍රියා පදය තෝරන්න

1. සති දෙකක් පමණ රෝගාතුරව සිටි මහනායක හිමියෝ අපවත් (විය/වූහ)
2. වලිසිංහ හරිශ්චන්ද්‍ර තුමා රැස්ව සිටි ජනතාව (ඇමතුවේ ය/ඇමතූහ).
3. සිත් තුළ දැහැමි සිතුවිලි පහළ (වේවා/වෙත්වා).
4. ඇතැම්හු ප්‍රත්‍යය ලාභයෙන් කටයුතු (කරති/කරහු).
5. දායක දායිකාවන් විසින් උන්වහන්සේ ගෞරවපූර්වකව පිළිගන්නා (ලදි/ලදහ).

(ආ) 'කර' ධාතු ප්‍රකෘතිය ඇසුරෙන් පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට නිදසුන් සපයන්න

i. ප්‍රයෝජ්‍ය ක්‍රියාව
ii. විධි ක්‍රියාව
iii. ආශීර්වාද ක්‍රියාව
iv. මිශ්‍ර ක්‍රියාව
v. පූර්ව ක්‍රියාව
vi. අසම්භාව්‍ය ක්‍රියාව

(ඇ) කළු අකුරින් මුද්‍රිත පද කිනම් ක්‍රියා වර්ගවලට අයත් දැයි ලියන්න.

1. **කියග** මගිය, එනු කොහි සිට
2. **කියත** උන් මෙතෙපල - ආයේය ඇදුරු ගුත්තිල
3. මලේ බඹරු මෙන් පිරිවර ඇති **වේවා**
4. **කියමින්** ගී රස මියුරු
5. සිඳ බිඳ දුක් සසර

## ප්‍රායෝගික අභ්‍යාස

1. අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ මෙහෙවර ආගමික, සමාජීය හා ශාස්ත්‍රීය වශයෙන් වෙන් වෙන්ව සාකච්ඡා කරන්න.
2. 'උතුම් දිවියක අසිරිය' යන මැයෙන් අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ චරිතය පිළිබඳ විශේෂාංග ලිපියක් සකසන්න.